**හාලිඇල ප්‍රාදේශීය සභාව - 2023**
**-------------------------------------**

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

හාලිඇල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට හාලිඇල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

**1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු බැංකු පොලී ආදායම රු.433,333 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2024 ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය සහ සංවර්ධන අරමුදල් ගිණුමේ (ජංගම නොවන වගකීම්) ශේෂය රු.15,933,064 ක් වුවත් එය රු.16,150,214 ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී මෙම මුදල දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගැලපීමට කටයුතු කරන බව. | ශේෂ සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කිරීම හෝ ශේෂ නිරවුල් කිරීම කළ යුතුය. |
| (ඇ) | කර්මාන්තය ඉටුකළ බවට කාර්මික නිලධාරී සහතිකය සහ භෞතික පැවැත්ම සනාථ නොකළ කර්මාන්ත 04ක ඇස්තමේන්තු වටිනාකම රු.3,449,498 ක් කර්මාන්ත ණයහිමියන් යටතේ දක්වා තිබුණි. | 2024 වර්ෂයේ කර්මාන්ත 02 ක් නිම කර ඇති බවත් ඉතිරි කර්මාන්ත නිම කිරීමට නියමිත බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක අරමුදල් ශේෂය, මූල්‍ය ප්‍රකාශන අනුව රු. 1,332,053 ක් වූ අතර, ශේෂ සනාථන අනුව රු.1,307,744 ක් වීමෙන් රු.24,309 ක වෙනසක් පැවතුණි. | සනාථන ශේෂය 2023 ජූනි මස දක්වා පමණක් ගෙන ඇති බව | ගිණුම් ශේෂ හා අනුරූපී වාර්තා අනුව වෙනස්කම් හඳුනාගෙන ශේෂ සැසඳීම කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතු වටිනාකම රු. 9,907,410ක පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල, වරිපනම් බදු, අක්කර බදු සහ හිඟහිටි ජල ගාස්තු වලට අදාළව විශ්‍රාම වැටුප් හිමි නාමලේඛනය, පෞද්ගලික ලිපිගොනු, සභා තීරණ හා කළමනාකරණ තීරණ, හිඟ ආදායම් හා කාල විශ්ලේෂන වාර්තා යන සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ශේෂ සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | දීර්ඝ කාලයක සිට පැවත එන පැවැත්ම හා ලැබීම් නිශ්චිතව හඳුනා නොගත් ජංගම වත්කම් රු.468,559 ක් සහ හිඟහිටි ආදායම් රු.31,308,247 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | දීර්ඝකාලීනව පැවත එන සාක්ෂි සොයාගත නොහැකි ශේෂයක් බැවින්, ගිණුම් තුළින් ඉවත් කිරීමට කටයුතු කරන බව. | ශේෂ සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කිරීම හෝ ශේෂ නිරවුල් කිරීම කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| | XIX පරිච්ඡේදයේ 4.1 වගන්තිය | රාජකාරී ගමන් බිමන් සඳහා ගමනේ දුර සැලකිල්ලට නොගෙන අවස්ථා 43 කදී සංයුක්ත දීමනා ලෙස රු.40,750 ක් ගෙවා තිබුණි. | වැඩියෙන් කළ ගෙවීම් අයකිරීමට කටයුතු කරමින් පවතින බව. | නීත්‍යානුකූල නොවන ගෙවීම් ආපසු අයකරගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 | 2011, 2012, 2014, 2018 සහ 2021 වර්ෂ වලට අදාළව අවස්ථා 07 ක රු.1,215,627 ක නොපියවූ අත්තිකාරම් ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | බොහෝමයක් මෙසේ පැවති මුදල් අයකරගෙන ඇති බව හා ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.22,476,196 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,211,206 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 2,668,492 | 2,666,279 | 1,331,004 | 1,335,275 | 2,669,895 | 2,666,279 | 2,072,265 | 594,014 |
| (ii) | කුලී | 1,562,862 | 1,785,402 | 1,375,610 | 409,792 | 3,885,902 | 3,934,032 | 3,364,203 | 569,829 |
| (iii) | වෙනත් ආදායම් | 5,569,000 | 6,715,887 | 4,714,221 | 2,001,666 | 1,418,800 | 1,693,608 | 1,341,333 | 352,275 |
| | **එකතුව** | 9,800,354 | 11,167,568 | 7,420,835 | 3,746,733 | 7,974,597 | 8,293,919 | 6,777,801 | 1,516,118 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 02ක කාලයක සිට පැවත එන මස්කඩ,මාළු කඩ සහ සතිපොළ බදු දීමේ වාර්ෂික හිඟ ටෙන්ඩර් බදු රු. 2,398,341 ක් සමාලෝචිත වර්ෂයේදීද අයකරගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකරගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.16,019,773 ක් හා හිඟ මුද්දර ගාස්තු රු.19,765,054ක් ගෙන්වාගෙන නොතිබුණි. | මෙම මුදල් ලබාදෙන ලෙස අදාළ දෙපාර්තමේන්තු දැනුවත් කර ඇති බව. | හිඟ ආදායම් ගෙන්වාගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 මාර්තු 19 දින සභාපතිවරයාගේ ධූර කාලය අවසන්ව තිබුණද, සභාපතිවරයාට ලබා දී තිබුණු රු.134,900 ක් වටිනා Dell වර්ගයේ ලැප්ටොප් පරිගණකය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම ප්‍රාදේශීය සභාවට භාරදී නොතිබුණි. | ලැප්ටොප් පරිගණකය ලබාගැනීමට කටයුතු කරන බව. | කඩිනමින් සභාවට අයත් වත්කම් නැවත භාර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | කර්මාන්ත වල නඩත්තු කාලය අවසන් වූ කර්මාන්ත 15 ක රු.390,235 ක රැඳවුම් මුදල් නිදහස් කරන ලෙස ඉල්ලීම් කර මාස 01 සිට මාස 05 කාලයක් කල් ගතවී තිබුණද, අදාළ රැඳවුම් මුදල් නිදහස් කර නොතිබුණි. | ඉදිරියේදී ගෙවීම් කිරීමට කටයුතු කරන බව. | ගිවිසුම් අනුව කර්මාන්තයේ වැඩ නිමකර ඇති බව තහවුරු කරගෙන රැඳවුම් මුදල් නිදහස් කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීම ප්‍රමාදය හේතුවෙන් රු.428,441 ක අධිභාර ගාස්තුවක් සභා අරමුදලින් ගෙවීමට සිදුව තිබුණි. අධිභාර ගෙවීමට හේතුව සම්බන්ධව වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉදිරියේදී ගෙවීමට කටයුතු කරමින් පවතින බව. | අධිභාර ගෙවීමට හේතුව සම්බන්ධව වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව පරිගණක උපාංග, ජල ටැංකි, ජංගම දුරකථන, Dell වර්ගයේ මොනිටරය, පරිගණක මේස, පරිගණක පුටු, ලැප්ටොප්,ටෝනර් ආදී කාර්යාල උපකරණ හා ද්‍රව්‍ය තොග ඒකක 722 ක ඌනතාවයක් පැවතුණි. මේ පිළිබඳ සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | පැරණි තොග ලේඛනය හා නව තොග ලේඛනය සසඳා ගැලපීම් කිරීමට කටයුතු කරන බව. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවල නිර්දේශ ක්‍රියාත්මක කර තොග ලේඛන නිවැරදිව පිළියෙලකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව විසින් ධාවනය සඳහා යොදාගනු ලබන ජල බවුසරයක අයිතිය සභාව වෙත පවරා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාවට තාවකාලිකව පවරා ඇති බව. | සභාව සතු වත්කම් පවරාගෙන ලේඛනගත කළ යුතුය. |
| (ඇ) | සභාවට අයත් ට්‍රැක්ටයක් සහ ට්‍රැක්ටර් ටේලර් 03 ක් වසර 2 සිට 10 අතර කාලයක සිට නිෂ්කාර්යව පැවතුනි. | 2023 භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ අනුව කටයුතු කරන බව. | වත්කම් උපරිම කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |

## 3.4 අවිධිමත් ගණුදෙනු

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|
| සභාවේ මහජන නියෝජිතවරුන්ට සමාලෝචිත වර්ෂයේ මාර්තු මාසයේදී මන්ත්‍රී දීමනා රු.177,833 ක් සහ දුරකතන දීමනාව රු.12,467 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අය කර ගැනීමට ඇත්තේ මහජන නියෝජිතයින්ගෙන් රු.126,500 ක් හා දුරකථන දීමනාවෙන් රු.8433.41 ක් පමණි. | වැඩිපුර ගෙවීම් වැලැක්වීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කළ යුතුය. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා ප්‍රධාන ගේට්ටුව අසළ පැති බැම්මේ ඉතිරි කොටස ඉදිකිරීමේ කර්මාන්තයේ වැඩ අයිතම 02 හා 03 හි ඉටු නොකළ වැඩ වෙනුවෙන් රු.122,755 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | කාර්මික නිලධාරි වාර්තාව අනුව මිනුම් ලබාගෙන ඇත්තේ ඒකාබද්ධ ක්‍රමයටය. විගණන නිලධාරීන් සමඟ මිනුම් ලබාගෙන ඇත්තේ බාහිර ගිණුම් ක්‍රමයටය.බැම්ම ඇතුළත මිනුම් ලබාගැනීම පුරවා ඇති පස් ඉවත්කිරීම සිදු කළහොත් බැම්මේ ස්ථායිතාවයට හානි වන බව හා රඳවුම් මුදල් මෙතෙක් ගෙවා නොමැති බව. | බිල්පත් පරීක්ෂා කිරීමේදී වැඩිපුර ගෙවීම් කර තිබුණු බව කාර්මික නිලධාරි පිළිගෙන ඇත. එබැවින් වැඩිපුර ගෙවීම් අයකරගත යුතුය. |
| (ආ) | ඉහත 3.5 (අ) ඡේදයේ සඳහන් කර්මාන්තයේ ප්‍රමාද ගාස්තු අය කිරීමේදී ICTAD/SBD/03 චක්‍රලේඛය අනුව කටයුතු නොකර ප්‍රමාද දින 27 ක් වෙනුවෙන් ප්‍රමාද ගාස්තුව රු.12,832 ක් අඩුවෙන් අයකර තිබුණි. | ගිවිසුම් අනුව ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ICTAD/SBD/03 චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |